# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 29 දරන
# රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජූනි මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : ශත 45 යි. තැපැල් ගාස්තුව : ශත 60 යි.

# 1984 අංක 29 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 27 වන දින.]

එල්. ඩී.—ඕ. 35/83

**ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ පනත 1984 අංක 29 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 13 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) "පස් දෙනකුගෙන්" යන වචන වෙනුවට "නවදෙනකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) "එසේ පත් කරනු ලබන තැනැත්තන් අතුරින්" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"එසේ පත් කරනු ලබන තැනැත්තන් අතුරින් තිදෙනකු—

(අ) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ;

(ආ) නිවාස විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ;

(ඇ) පශු සම්පත් සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ

එක් එක් නියෝජිතයකු බැගින් වන සේ පත් කරනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියෙහි (1) වන උප වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය සංශෝධනය කිරීම.

(අ) ඒ උපවගන්තියේ (අ) ඡේදයෙහි (i) වන සහ (ii) වන අනුඡේදවල දැක්වෙන "යම් කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයක් සඳහා" යන වචන වෙනුවට ඒ එක් එක් අනුඡේදයෙහි "යම් නිවාස, කෘෂිකාර්මික හෝ කාර්මික කාර්යයක් සඳහා" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ උපවගන්තියෙහි (ඇ) ඡේදයෙහි "කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධනය" යන වචන වෙනුවට "නිවාස, කෘෂිකාර්මික හෝ කාර්මික සංවර්ධනය" යන වචන සහ (ඇ) ඡේදයෙහි "කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තවල" යන වචන වෙනුවට "නිවාස කටයුතුවල, කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තවල" යන වචන ආදේශ කිරීමෙන් ;

2—ඒ 076881—6,275 (84/05)

(ඇ) ඒ උපවගන්තියෙහි (ඉ) සහ (ඊ) ඡේදවල "කෘෂිකාර්මික හෝ කාර්මික" යන වචන වෙනුවට ඒ එක් එක් ඡේදයෙහි "නිවාස, කෘෂිකාර්මික හෝ කාර්මික" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඈ) ඒ උපවගන්තියේ (උ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(උ) ආණ්ඩුව විසින් හෝ මහ බැංකුව විසින් හෝ අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන වෙනත් යම් බැංකුවක් හෝ ආයතනයක් විසින් හෝ නිකුත් කරනු ලැබූ නැතහොත් සහතික කරනු ලැබූ ස්කන්ධ, කොටස්, ණය පත්‍ර, උකස්, බැඳුම්කර හෝ සුරැකුම් පත් මිල දී ගැනීම, විකිණීම, ඒවායෙහි ආයෝජනය කිරීම හෝ ඒවා පිළිබඳව කටයුතු කිරීම ; " ;

(ඉ) ඒ උපවගන්තියේ (ච) ඡේදයෙහි "වාරික තැන්පතු" යන වචන වෙනුවට "වාරික තැන්පතු, ඉතිරි කිරීමේ තැන්පතු, හිමිසුම් තැන්පතු සහ ණය සම්බන්ධිත ඉතිරි කිරීමේ තැන්පතු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඊ) ඒ උපවගන්තියෙහි (ජ) ඡේදයෙහි "කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තයන්හි" යන වචන වෙනුවට "නිවාස කටයුතුවල, කෘෂිකර්මයෙහි හෝ කර්මාන්තයන්හි" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(උ) ඒ උපවගන්තියෙහි (අඅ) යන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන් :—

"(ආආ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් බැංකුවකින් හෝ වෙනත් ආයතනයකින් පිරිනමන ලද ණය සඳහා නැවත මුදල් සැපයීම.".

*ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම.*

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "රුපියල් විසි කෝටියක්" යන වචන වෙනුවට "රුපියල් දෙසිය කෝටියක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය සංශෝධනය කිරීම.*

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(අ) ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි "මණ්ඩලය විසින් විකිණීමේ සහතිකයක් අත්සන් කළ යුතු අතර" යන වචන වෙනුවට "මණ්ඩලය වෙනුවෙන් මණ්ඩලයෙහි කිසියම් සාමාජිකයන් දෙදෙනකු විසින් විකිණීමේ සහතිකයක් අත්සන් කළ යුතු අතර" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින්" යන වචන වෙනුවට "(1) වන උපවගන්තිය යටතේ" යන වචන ආදේශ කිරීමෙන්.